# පාර්ලිමේන්තු බල අරගලය නිසා පළාත් සභා මැතිවරණය සම්පූර්ණයෙන්ම අඩපණ වෙලා

## - මැතිවරණ නිරීක්‍ෂණ සංවිධාන

■ ඉන්දික හේවාවිතාරණ



පාර්ලිමේන්තුවේ බල අරගලය හේතුවෙන් පළාත් සභා මැතිවරණය පැවැත්වීමේ වැඩපිළිවෙළ සම්පූර්ණයෙන්ම අඩපණ වී ඇතැයි මැතිවරණ නිරීක්‍ෂණ සංවිධාන සඳහන් කරයි.

සබරගමුව, නැගෙනහිර හා උතුරු මැද පළාත් සභාවල නිල කාලය අවසන් වී මාස 13කට අධික කාලයක් ගත වී තිබෙන බවත්, මධ්‍යම, වයඹ හා උතුරු පළාත් සභා නිල කාලය අවසන් වී මාස දෙකකට ආසන්න කාලයක් ගත වී තිබෙන බවත් පැෆරල් සංවිධානය සඳහන් කළේය.

පවතින සීමානිර්ණ ගැටලු පිළිබඳ පත්කළ සමාලෝචන කමිටු වාර්තාව පසුගිය මස 31 වැනිදා වන විට ජනාධිපතිවරයාට භාරදීමට නියමිතව තිබූ බවත්, එහෙත් දේශපාලන අර්බුදය හේතුවෙන් එවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොවූ බවත් එම සංවිධානයේ විධායක අධ්‍යක්‍ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවසීය.

අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් මෙම කමිටුව පත්කළ බවත්, එහෙත් මේ වන විට අගමැති ධුරය වෙනස් වී තිබෙන බවත් හෙතෙම පවසා සිටියේය.

මෙම තත්ත්වය මත පළාත් සභා මැතිවරණය කුමන දිනයක පැවැත්වේද යන්න හෝ කිව නොහැකි තත්ත්වයක් ඇති වී තිබෙන බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය සඳහන් කළේය.

මෙය පළාත් සභාවලට නියෝජිතයන් පත්කර ගැනීමට තිබෙන අයිතිවාසිකම් උදුරා ගැනීමක් බවද එම සංවිධානයේ ජාතික සම්බන්ධීකාරක මංජුල ගජනායක මහතා පවසා සිටියේය.

මේ වන විට පළාත් සභා 06ක නිල කාලය අවසන් වීම හේතුවෙන් එම ආයතන නිලධාරී පාලනයට නතු වී තිබෙන බවත්, මේ හේතුවෙන් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට අදාළ කටයුතු කඩිනම් විය යුතු බවත් ඔහු ප්‍රකාශ කළේය.